# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2234/7 - 2021 ජූනි මස 29 වැනි අඟහරුවාදා - 2021.06.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත**

2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 75 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින්, 2021 අප්‍රේල් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, 2021 අංක 9 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමුවන උපලේඛනයේ II වන කොටසේ (ආ) ඡේදයේ (Liv) අයිතමයේ සඳහන් කාර්යයන් සඳහා, මෙම ගැසට් පත්‍රයේ උපලේඛනයේ II වන කොටසේ සඳහන් කොන්දේසිවලට යටත්ව උපලේඛනයේ I වන කොටසේ සඳහන් කර ඇති තොරතුරු තාක්ෂණය සහ සඵල සේවා නියම කරමි.

මහින්ද රාජපක්ෂ,  
මුදල් අමාත්‍ය.

2021 ජූනි මස 29 වැනි දින,  
කොළඹ,  
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

I වන කොටස

1. ශ්‍රී ලංකාවේ සංවර්ධනය කරනු ලබන ඕනෑම වර්ගයක මෘදුකාංගයකට අදාළ අනුකූලනය (adaptation), තිබෙන තත්ත්වයෙන් උසස් කිරීම (upgrading), වැඩි දියුණු කිරීම (enhancement), ක්‍රියාත්මක කිරීම (implementation) සහ ඒ හා සමාන සේවාවන්.

2. යම් දේශීය ආයතනයක් විසින් යම් තැනැත්තෙකුට සපයනු ලබන පහත සඳහන් සේවාවන් :-

   (අ) පරිගණක වැඩසටහන්කරණ සේවා;
   (ආ) ව්‍යාපාරික තොරතුරු තාක්ෂණ යෙදුම් පිහිටුවීම (deployment of business Information Technology applications);
   (ඇ) වෙබ් අඩවි සංවර්ධනය සඳහා වන සේවාවන්;
   (ඈ) මාර්ගගත වේදිකා (online platforms) සංවර්ධනය සඳහා වන සේවාවන්;
   (ඉ) ජාල ඒකාබද්ධකරණය (network integration);
   (ඊ) දත්ත ගවේෂණ (data mining) සහ දත්ත පරිපාලන සේවාවන් සඳහා දත්ත සැකසීම;
   (උ) දේශීය වලාකුළු සේවා (local cloud services);
   (ඌ) කෘත්‍රිම බුද්ධිය;



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(එ) සාර්ව ද්‍රව්‍ය අන්තර්ජාලය (Internet of Things); සහ
(ඒ) සයිබර් ආරක්ෂාව.

3. ඉලෙක්ට්‍රොනිකව හෝ පරිගණක පද්ධතියක් භාවිතයෙන් හෝ ජංගම ඉලෙක්ට්‍රොනික උපාංග භාවිතයෙන් යම් දේශීය ආයතනයක් හෝ ශ්‍රී ලංකාවේ සිටින තැනැත්තෙකු විසින් යම් තැනැත්තෙකුට පහත සඳහන් පසු අන්ත (back-office) සේවා සැපයීම -

(අ) දුරස්ථ තොරතුරු තාක්ෂණ නඩත්තුව;
(ආ) දත්ත සෙවුම් ඒකාබද්ධ කිරීම සහ විශ්ලේෂණය (data search integration and analysis);
(ඇ) සායනික අත්හදාබැලීම් හැර සායනික දත්ත සමුදා කළමනාකරණ සේවා; සහ
(ඈ) තොරතුරු තාක්ෂණ සේවා බාහිරකරණය (information technology service outsourcing).

4. (අ) භූගෝලීය තොරතුරු පද්ධතිය;
(ආ) ඉංජිනේරු සහ නිර්මාණ සේවා; සහ
(ඇ) සජීවීකරණ හෝ අන්තර්ගත සංවර්ධනය හා කළමනාකරණයට අදාළව

දැනුම හා උසස් විශ්ලේෂණාත්මක සහ තාක්ෂණික කුසලතා යෙදවීම අවශ්‍ය වන තොරතුරු තාක්ෂණය ප්‍රධාන වශයෙන් සහාය කර ගනිමින් හෝ යොදා ගනිමින් දැනුම් සැකසුම් බාහිරකරණ සේවා (knowledge process outsourcing services) සැපයීම.

## II වන කොටස

1. තොරතුරු තාක්ෂණයට අදාළ දේශීය තාක්ෂණික සේවකයින්ගේ සංඛ්‍යාව, I වන කොටසේ 1 වන අයිතමයේ සඳහන් සේවාවන් සැපයීමෙහි නිරත වන එවැනි සමුච්චිත තාක්ෂණික සේවක සංඛ්‍යාවෙන් සියයට හැත්තෑවකට (70%) නොඅඩු විය යුතුය.

2. I වන කොටසෙහි 1 වන අයිතමයේ සඳහන් සේවාවන් හැර එම කොටසෙහි සඳහන් සේවාවන් සම්බන්ධයෙන්, අවම "දේශීය අගය එකතු කිරීම" එවැනි සේවාවන්හි දළ ආදායමෙන් සියයට පනහකට (50%) නොඅඩු විය යුතුය.

"දේශීය අගය එකතු කිරීම" ගණනය කිරීම සඳහා, එවැනි තැනැත්තෙකු විසින් ආනයනය කරන ලද හෝ දේශීයව මිලදී ගත් නමුත් ආනයනය කරන ලද යම් භාණ්ඩවල පිරිවැය හෝ ශ්‍රී ලංකාවෙන් පිටත තැනැත්තෙකුට යම් සේවාවක් සඳහා ගෙවනු ලබන පිරිවැය, එවැනි සේවාවන්හි දළ ආදායමෙන් අඩු කරනු ලැබේ.

3. මෙම නිවේදනය ක්‍රියාත්මක වන දිනට පවත්නා ව්‍යාපාරයක් කැඩීමෙන් (splitting-up) පිහිටුවන ලද හෝ ඇති කරන ලද ඕනෑම ව්‍යාපාරයක් සුදුසුකම් නොලබයි.

07 - 358

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.